# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

## Viscometer Baths 02 ක් සැපයීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කරවීම සඳහා ප්‍රසම්පාදනය

### ශ්‍රී ලංකා දුම්රිය සේවය : IFB අංකය - SRS F.8052

1. කොළඹ, ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත Viscometer Baths 02 ක් සැපයීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කරවීම සඳහා දේශීය නිෂ්පාදකවරුන්ගෙන් / සැපයුම්කරුවන්ගෙන් මුද්‍ර, තබන ලද ලංසු කැඳවනු ලැබේ.
2. ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය (NCB) මගින් ලංසු මෙහෙයවේ.
3. මේ පිළිබඳව උනන්දුවක් දක්වන යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට 2025-01-29 දින සිට 2025-03-03 දක්වා සතියේ වැඩකරන දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලයේදී පහත දක්වෙන ලිපිනයෙන් වැඩිදුර තොරතුරු ලබා ගැනීමට සහ ලංසු ලිපි ලේඛන පරීක්ෂාකර බැලීමට හැක.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන)**
**දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.**

| | |
|---|---|
| **දුරකථන අංක** | : 94 (11) 2 438078 හෝ 94 (11) 4600202 |
| **ෆැක්ස් අංකය** | : 94 (11) 2 432044 |
| **ඊමේල්** | : srs.slr@gmail.com, tender1@railway.gov.lk |
| **වෙබ් අඩවිය** | : www.railway.gov.lk |

4. ලංසුකරුවන් විසින් Viscometer Baths ඇතුළු විශ්ලේෂණ උපකරණ නිෂ්පාදනය සඳහා තමන්ට ඇති හැකියාව සහ ශක්‍යතාව සනාථ කිරීම සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළයුතු අතර, Viscometer Baths ඇතුළු විශ්ලේෂණ උපකරණ නිෂ්පාදනය සඳහා ISO 9001 : 2008 සහතිකය හෝ සමාන සහතිකයක් ලබා තිබිය යුතුය.
5. නැවත නොගෙවන ප්‍රසම්පාදන ගාස්තු රු. 2,875.00 ක් පමණක් ගෙවීමෙන් හා ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් 2025-01-29 සිට 2025-03-03 දක්වා දිනවල ප.ව. 3.00 තෙක් අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් සැකසී ඇති ලංසු ලිපි ලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදීගත හැක.
6. සියලුම ලංසු සමග ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බැංකුවක් විසින් නිකුත් කරන ලද රු. 100,000.00 ක වටිනාකමින් යුත් කොන්දේසි විරහිත ඇපකරයක් ආකාරයේ ලංසු සුරක්ෂණයක් අමුණා එවිය යුතුය.
7. ලංසු 2025-03-04 දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර පහත ලිපිනය වෙත ගෙනවිත් භාරදිය යුතු අතර, ලංසු භාරගැනීමේ කාලය අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී වනමෙන් ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ආරාධනා කෙරේ. ප්‍රමාද වී ලැබෙන ලංසු පිළිනොගැනේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තු කාර්යාලය,**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය,**
**ඕල්කොට් මාවත, කොළඹ 10.**

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය.**

**යොමු අංකය : SRS/F.8052**